දිවි තොර කරගැනීම් මහජන සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් මාධ්‍ය ඔස්සේ පෙන්වා දීම අවශ්‍යතාවයකි. නමුත්, එම වාර්තා කිරීම් හැකිතාක් ප්‍රවේසම් සහගතව සහ මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කළ යුතු වේ. ඒ, අනුකාරක දිවි තොර කර ගැනීම් අවම කිරීම සඳහායි.
දිවි තොර කර ගත් අය ලියූ ලිපි ආදිය පළ නොකිරීම එම මාර්ගෝපදේශයන්ගෙන් එකකි.
කෙසේ නමුත්, මාධ්‍ය විසින් එම දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් කෙතරම් දුරට පිළිපදින්නේද යන්න ගැටළුවකි.
නිට්ටඹුව, පින්නගොල්ල ප්‍රදේශයේ දෙදරු පියෙකු ගේ මරණය මාධ්‍ය වාර්තා කර තිබූ ආකාරය සලකා බලමු.
විශේෂයෙන්ම රටක් වශයෙන් ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින අතරවාරයේ, ආර්ථික ගැටලු නිසා දිවි තොර කර ගත් බවට පැවසෙන පුවත් වාර්තාවන් මෙසේ ප්‍රවේසමකින් තොරව පළ කිරීම කෙතරම් වගකීම් සහගත ද?
උපකාරක අංකයක් පළ කරමු! ජීවිතයක් රැක ගනිමු!
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)
(මෙම පුවත, එදින මෙම පුවත්පතේ සහෝදර ඉංග්‍රීසි පුවත්පත තුළ වාර්තා වී නොතිබුණි.)
මූලාශ්‍ර:
https://www.who.int/cam.../world-suicide-prevention-day/2022
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL...

